පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය **09**

විෂයය :- **ක්‍රිස්තියානි ධර්මය**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : **පැය 03 යි.**

## I කොටස

❖ **නිවැරදි උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.**

1. කිතුණු ජීවිතයේ වැදගත්ම සන්නිවේදන මාධ්‍ය වන්නේ,
   I. යාච්ඤාව II. ප්‍රේමය III. බයිබලය කියවීම

2. ජේසුස් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාව වන්නේ,
   I. නමෝ මරිය........ II. ස්වර්ගයේ වැඩසටහන III. අහසට පොළොව මැවූ

3. ජේසුතුමාගේ ප්‍රථම හාස්කමයි,
   I. කොරෙකු සුව කිරීම II. මළවුන් නැගිටු වීමයි. III. වයින් මිදි යුෂ කිරීම.

4. හාරදහසට කෑම දීමේදී ජේසුස් වහන්සේ භාවිතා කලේ,
   I. රොටි 5යි මාළු 2යි
   II. රොටි 7යි මාළු ස්වල්පයයි.
   III. රොටි 10යි මාළු 2 යි

5. "ස්වාමින් වහන්සේ මාගේ එඬේරාය. මට හිඟයක් නොවන්නේය." ඉහත බයිබල් පදයෙන් කියවෙන සත්‍යතාවය නම්,
   I. දෙවියන් වහන්සේ අපගේ දිව්‍ය පෝෂකයාණන් බව ය.
   II. දෙවියන් වහන්සේ අපගේ දිව්‍ය ආරක්ෂකයා බව ය.
   III. දෙවියන් වහන්සේ අපගේ දිව්‍ය වෛද්‍යවරයා බව ය.

6. ශුද්ධාත්ම බලය ගෝලයාහට ලැබුනේ,
   I. නත්තල් දිනයේ ය.
   II. පාස්කු දිනයේ ය.
   III. පෙන්ත කොස්ත දිනයේ ය.

7. ගෝලයන් සිදුකල ප්‍රථම හාස්කමය,
   I. සුදර්ශන දොරටුව අසල සිටි කොර මිනිසා සුව කිරීම.
   II. අතක් පණ නැති මිනිසා සුව කිරීම.
   III. දෝර්කස්ව මළවුන්ගෙන් නැගිටු වීම

8. දෝර්කස් යනු,
   I. ඇඳුම් මසන්නියකි. II. ගුරුතුමියකි. III. රෙදි සෝදන්නියකි.

9. පළමු වේද සාක්ෂිකයා වන්නේ,
   I. පිලිප්තුමා II. ජාකොබ්තුමා III. ස්තේපන්තුමා

10. කිතුණු ගෙවල් වලට පැන කිතුණු පුරුෂයන් හා ස්ත්‍රීන්ව අත්අඩංගුවට ගනු ලැබුවේ........... විසිනි.

I. ස්තේපන් II. සාවුල් III. ජාකොබ්

11. තරුණ තරුණියන් අතර වැඩි වශයෙන් පවතින මාංසික තෘෂ්ණාවකි.

I. බීමත්කම II. කොඩි වින III. රූප වැඳීම

12. මනුෂ්‍යාට අත්විඳීමට සිදුවන මානසික පීඩාවකි.

I. පිළිකා රෝගීන් ඉහල යාම.
II. නාය යාමෙන් පීඩා විඳීම.
III. අනාගත බලාපොරොත්තු සුන්වීම.

13. තමකම නැසීම යනු,

I. තමන් තුල ඇති මමත්වය බැහැර කිරිම.
II. අන් අයට ප්‍රේම කිරිමයි.
III. සැම දෙනා එක ලෙස සැලකිමයි.

14. ජුදා සමාජයේ බරපතල වරදකරුවෙකුට හිමි වු නින්දිත දඬුවම් ක්‍රමය නම්,

I. සිරගෙයි දැමීම. II. කුරුසි පත් කිරිම. III.කසපහර ගැසීම.

15. ආත්මික ජීවිතය පෝෂණය සඳහා අප කල යුත්තේ,

I. ලෞකික ජීවිතය පිනවීමය.
II. සැම දෙයකදිම ප්‍රමුඛත්වය දේව කැමැත්තට දීමය.
III. හොඳින් ඉගෙන ගැනීමය.

16. මැවිල්ලේ මුදුන්මල්කඩ වන්නේ,

I. මිනිසාය. II. සූර්‍යයාය III.සාගරය.

17. ජුදා විවාහ මංගල්‍යයකදී සිදු වු චාරිත්‍රයකි.

I. දින හතක් මංගල්‍යය පැවැත්විම.
II. පැමිණෙන අමුත්තන්ට මිදි යුෂ දීම.
III. ඉහත පිළිතුරු දෙකම නිවැරදිය.

18. අපගේ අවශ්‍යතාවයකදී දේව දරුවන් වන අපගේ වගකීමකි,

I. සැම අවශ්‍යතාවකදී ම ජේසුස් වහන්සේට ආරාධනා කිරිම.
II. සැම අවස්ථාවකදී යාළුවන්ගෙන් උපදෙස් ගැනීම.
III. සැම අවශ්‍යතාවයකටම සමිති සමාගම්වලින් සහය ලබා ගැනිම.

19. නිවැරදි සත්‍යතාවය අපට පසක් කර දෙනු ලබන්නේ,

I. පොත පතෙන් ලද දැනුමය.
II. ශුද්ධ වූ වචනය ය.
III. ගුරුවරුන් ය.

20. මාංසික තෘෂ්ණා දැක්වෙන පිළිතුර,

I. සතුට හා ප්‍රේමය ය.
II. ප්‍රේමය හා වෛරය ය.
III. වෛරය හා ඊර්ෂ්‍යාව ය.

(2x20 = 40)

## II කොටස

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

(01.) I. නෝවා පිළිබඳ බයිබලයේ සඳහන් කරුණු දෙකක් ලියන්න.

II. දාවිත්තුමා සතුරාට ප්‍රේම කල අවස්ථා දෙකක් ලියන්න.

III. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා දෙකක් ලියන්න.

IV. ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව තුල සාමූහිකත්වය පෙන්වා ඇති අවස්ථා දෙකක් ලියන්න.

V. කානා නුවරදී ජේසුස් වහන්සේ කල හාස්කම් දෙකක් ලියන්න.

VI. "දෙයවින් වහන්සේ අපගේ දිව්‍ය පෝරකයාණන් වේ." ඒ බව සනාථ කිරීමට පරණ ගිවිසුමේ උදාහරණ දෙකක් ලියන්න.

VII. ජේසුස් වහන්සේ කල සුව කිරීම් දෙකක් ලියන්න.

VIII. ස්වර්ගාරෝහණය වන අවස්ථාවේ ජේසුස් වහන්සේ ප්‍රේරිතයන්ට ප්‍රකාශ කලේ කුමක්ද ?

IX. ශුද්ධාත්ම බලයෙන් පූර්ණ ගෝලයන් ක්‍රියා කලේ කෙසේ ද?

X. මුල් කිතුණු සභාවේ සාමාජිකයින් මුහුණ දුන් පීඩාවන් දෙකක් ලියන්න. (2x10 = 20)

(02.) I. ප්‍රඥාව................. දීමනාවකි. හිස්තැන පුරවන්න. (ල.2)

II. ප්‍රඥාව භාවිතා කර මිනිසා විසින් නිර්මාණය කර ඇති තාක්ෂණික මෙවලම් තුනක් ලියන්න. (ල.3)

III. අන්තර්ජාල පහසුකම හා මුහුණු පොත භාවිතයේ වාසි තුනක්ද හා අවසි දෙකක් ද ලියන්න. (ල.5)

(03.) I. දේව වචනය යනු කුමක්ද? (ල.2)

II. දේව වචනය අවබෝධ කර ගැනීමට අපට මග පෙන්වන අයවරුන් තුන් දෙනෙක් ලියන්න. (ල.3)

III. දේව වචනය තුළින් ඔබේ ජීවිතයට ලැබෙන මග පෙන්වීම් පහක් ලියන්න. (ල.5)

(04.) I. අපට සිදුවන ව්‍යසන බෙදිය හැකි ආකාර දෙක කුමක්ද? (ල.2)

II. ඔබ ලබන පීඩාවන් හා අභියෝග හමුවේ දෙවියාණන් වහන්සේ ඔබට සරණ හා ශක්තිය සැපයූ අවස්ථා තුනක් ලියන්න. (ල.3)

III. ව්‍යසන හා පිඩාවන්ට පත් වූ අය වෙනුවෙන් ඔවුන්ව ඉන් මුදවා දෙන මෙන් ඉල්ලා දෙව්පියාට යාච්ඤාවක් ලියන්න. (ල.5)

(05.) I. යමෙක් මා අනුව එන්නට කැමැත්තේ ද, ඔහු................... නසා ................... මා අනුව ඒවා (මතෙව් 16.24) හිස්තැන් පුරවන්න. (ල.2)

II. තමකම නසමින් ජේසුස් වහන්සේ අනුගාමී වන්නාවූ අපගේ ජීවිත තුල තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න. (ල.3)

III. ජේම්ස්.එච්.ඩැරල් දේවගැතිවරයාගෙන් ඔබේ ජීවිතයට ගත හැති ආදර්ශ පහක් ලියන්න. (ල.5)

(06.) I. කිතුණුවන් තම සටන දියත් කල යුත්තේ කාට එරෙහිව ද? (ල.2)

II. කිතුණු අපගේ සන්නාහ සන්නද්ධ ආයුධ තුනක් ලියන්න. (ල.3)

III. ජේසුස් වහන්සේගේ සෙබළෙකු වන අපගේ යාච්ඤාවක තිබිය යුතු ලක්ෂණ පහක් ලියන්න. (ල.5)

(07.) I. අප ජීවිතයේ පවත්වාගත යුතු ප්‍රතිපත්තීන් පාවුල්තුමා සඳහන් කර ඇති බයිබල් ග්‍රන්ථය කුමක් ද? (ල.2)

II. පාවුල්තුමා විසින් පෙන්වා දෙන පරිදි අපි අධිතක්සේරුවෙන් වැළකීය යුතු කරුණු තුනක් ලියන්න (ල.3)

III. **සුහද සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේමකරන්න. ගෞරවයෙන් තමන්ට වඩා අනෙක් අය උතුම් කොට සලකන්න. (රෝම 12:10)**

ඉහත බයිබල් පදයට අනුව සමාජය තුල ජීවත් වන්නේ කෙසේදැයි කරුණු පහක් ලියන්න. (ල.5)

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ක්‍රිස්තියානි ධර්මය

## පිළිතුරු පත්‍රය

(01.)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | – | I | 11 | – | I |
| 2 | – | II | 12 | – | III |
| 3 | – | III | 13 | – | I |
| 4 | – | II | 14 | – | II |
| 5 | – | I | 15 | – | I |
| 6 | – | III | 16 | – | I |
| 7 | – | I | 17 | – | III |
| 8 | – | I | 18 | – | I |
| 9 | – | III | 19 | – | II |
| 10 | - | II | 20 | - | III |

(01.) I.
- සත් ගුණවත් මිනිසෙක ලෙස
- පරම්පරාවේ නිදොස් මිනිසා ලෙස
- දෙවියන් වහන්සේ සමග සුහදතාවයෙන් හැසිරෙන්නකු ලෙස
- දෙවියන් වහන්සේ අභිමුවෙන් කරුණාව ලැබීය.

II.
- දාවිත් එන්ගෙදියෙදි සාවුල්ගේ ජිවිතය ගැලවීම.
- මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වීම.

III.
- ශ්‍රාවකයන් තෝරා ගැනිමට පෙර
- හාස්කම් සිදු කිරිමට පෙර
- සේවය ඇරඹීමට පෙර
- දුක් ප්‍රාප්තියට මුහුණ පෑමට පෙර

IV.
- අපගේ පියාණනි.
- අපගේ දවස්පතා ආහාරය
- අප මිදුව මැන
- අපට අත දුන මැනව
- අප පරීක්ෂාවට නොපමුණුවා
- අපගේ වරදට ය

V.
- ජලය මිදි යුෂ කිරිම.
- රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා සුව කිරිම

VI.
- ඊශ්‍රායෙල් ජනතාවට මන්නා හා වටුවන් සැපයීම.
- එලියා දිවැසිවරයාට ආහාර සැපයීම (ස්ත්‍රිය හා කපුටා මගින්)

VII. අදාල පිළිතුර වලට ලකුණු දෙන්න.

VIII. පොළොවේ සීමාන්තය දක්වා මාගේ සාක්ෂිකරුවන් වන්න.

IX. • ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ සාක්ෂි දරමින්
• බලවත් ලෙස දේශනා කරමින්
• බෞතීස්මය කරමින්
• ලෙඩුන් සුවපත් කරමින්
• දහස් ගණන් සෙනග ස්වාමින් වහන්සේ වෙත හරවමින්

X. • කිතුණුවන් ජුදා ව්‍යවස්ථාවට අපහාස කරන්නන් ලෙස සැලකීම.
• ඔවුන් රෝම අධිරාජ්‍යය අවනත නොවන පිරිසක් ලෙස සලකා පීඩාවලට ලක් කිරීම..............
**(34 පිටුවේ වැඩි දුරටත්)**

(02.) I. දෙවිඳුන්ගේ දීමනාවකි.

II. • ජංගම දුරකතනය
• අන්තර්ජාල පහසුකම් හා මුහුණු පොත
• යුධ උපකරණ
• රොබෝ යන්ත්‍ර යනාදිය

III. <u>වාසි</u>

- ඕනෑම ක්ෂේත්‍රයක තොරතුරු ලබා ගැනීම
- විශ්ව දැනුම ලබා ගැනීම
- විද්‍යුත් තැපැල් පහසුකම්
- ලෝකයේ ඕනෑම ස්ථානයකට සම්බන්ධ වීමට
- කාලය ඉතිරි වීම
- තොරතුරු හුවමාරුව

<u>අවාසි</u>

- දරුවන් නොමග යාම
- අන් අයව අගය කිරීම
- අන්තර්ජාල ක්‍රීඩා නිසා කාලය නාස්ති වීම
- අධ්‍යාපනය කඩා කප්පල් වීම
- පවුල් සම්බන්ධතා නැති වී යාම.

**(54-55 පිටු බලන්න)**

(03.) I. බයිබලයයි - දෙවියන් වහන්සේගේ වචනයයි

II. • පියතුමන්ලා හා තුමියන්ලා
• ගුරුවරුන්
• දෙමාපියන්
• වැඩිහිටියන්
• දහම් පාල් ගුරුවරුන්

III. • ජීවිතයට නිවැරදි මග පෙන්වයි.
• අපව ධෛර්යවත් කරයි.
• දේව නියමයන් උගන්වයි.
• සතුරන් පරාජය කරයි.
• ප්‍රීතිය ගෙන දෙයි.
• වැරදි, වැරදි ලෙස අපට අවබෝධ කර දෙයි.

(04.) I. මානසික පීඩා හා ශාරීරික පීඩා

II. සුදුසු පරිදි නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න.

III. සුදුසු පරිදි නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න.

(05.) I. • තමකම නසා
• කුරුසිය දරමින්

II. • තම කැමැත්ත හා අවශ්‍යතාවට වඩා අන් අයගේ කැමැත්ත හා අවශ්‍යතාවලට ඉඩ සැලසීම.
• ක්‍රිස්තුස් වහන්සේට අයත් දරුවන් ලෙස කටයුතු කිරිමේදී අප වෙත පැමිණෙන දුක් පීඩා ප්‍රීතියෙන් භාර ගැනීම.
• අන් අයගේ ජීවිත ගොඩනගමින් යහපත වෙනුවෙන් හිස්වීම. **(75 පිටුව)**

III. • සෑම අංශයක් කෙරෙහි දැනුම වර්ධනය කර ගැනීම.
• තම දක්ෂතා හා හැකියා අන් අයගේ යහපතට
• දේව කැමැත්තට මුල්තැන දීම.
• තම වගකීම් හරි ආකාරව ඉටු කිරිම.
• ජේසුස් වහන්සේව ජීවිතාදර්ශය කර ගැනීම.

(06.) I. • නපුරාගෙන්, යක්ෂයාගෙන්

II. • සත්‍ය නැමැති ඉග පටියයි
• දැමිටුකම නමැති ලය වැස්ම
• ඇදහිල්ල නමැති පලිහ**(77,78,78 පිටු)**

III. 79 පිටු

(07.) I. රෝමවරුන්ට

II. • තම බලය පිළිබඳ
• තම රූප ස්වභාවය පිළිබඳ
• තමා හා ධනය පිළිබඳ
• තම බුද්ධිය පිළිබඳ තමන් දරණ තනතුරු පිළිබඳ

III. • සුහද ප්‍රේමයෙන් ක්‍රියා කිරිම.
• උද්යෝගීමත් සිතින් කාර්යශීලීව සේවයේ යෙදීම.
• විපතේදී ඉවසිලිමත් වීම.
• පීඩා කරන්නට ආසිරි පැතිම.
• ප්‍රඥාව හේතුකොටගෙන උඩගු නොවීම.
• යහපතට ඇලුම්ව නපුරා පරාජය කිරිම.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න